# උපකාරක පන්ති ප්‍රචාරයේ දී භාවිත භාෂාව : වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

කුමුදු නයනී ගමගේ
වාග්විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

---

## ABSTRACT

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ප්‍රචලිත අංගයක් ලෙස උපකාරක පන්ති හඳුන්වා දිය හැකිය. මේවා ජනප්‍රියව පවතින්නේ 'ටියුෂන් පන්ති/ Tuition Class' ලෙසිනි. මෙම පන්ති පිළිබඳ ප්‍රචාරය කිරීමට විශේෂ උනන්දුවක් දක්වන අතර ඒ සඳහා පෝස්ටර් හා බැනර් භාවිත කෙරේ. මේ අතරින් උපකාරක පන්ති ප්‍රචාරය සඳහා භාවිත කරන පෝස්ටර්වල භාවිත භාෂාව පිළිබඳ විග්‍රහ කිරීම මේ අධ්‍යයනයේ අරමුණයි.

මේ අධ්‍යයනය සඳහා ලංකාවේ පළාත් පහක පමණ අලවා තිබුණු පෝස්ටර් 350ක් පමණ දත්ත වශයෙන් භාවිත කෙරේ. මෙම පෝස්ටර්වල භාවිත භාෂාව පහත සඳහන් අංශ යටතේ විග්‍රහ කෙරේ.

1. අක්ෂර සහ වචන සංවිධානය
2. ශබ්ද සංවිධානය
3. වාක්‍ය සංවිධානය
4. අර්ථ සංවිධානය

මෙම අධ්‍යයනයෙන් ප්‍රතිඵල වශයෙන් ලබා ගත් තොරතුරු පහත දැක්වේ.

1. භාෂා දෙකක අකුරු සහ වචන මිශ්‍රව භාවිත කිරීම
2. අනුප්‍රාසය ඉස්මතු කිරීම
3. වාක්කෝෂය
4. ලිඛිත භාෂාවට වඩා කථිත භාෂාව භාවිතය
5. අර්ථය පමණක් අවධාරණය කිරීම